2020.02.12 අරුණ

පිටුව 4

# ලංකාවේ ආර්ථික වර්ධනය වැඩිවන බව IMF කියලා

■ සාලිය කුමාර ගුණසේකර

මේ වසරේදී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය සියයට 3.7 ක් දක්වා වැඩිවන බවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නිකුත් කරන ලද නිවේදනයක සඳහන් වී ඇතැයි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රාජ්‍ය ඇමැති ලක්ෂ්මන් යාපා අබේවර්ධන පැවසීය.

ජනමාධ්‍ය අමාත්‍යාංශයේදී ඊයේ (11 වැනිදා) පෙරවරුවේදී පැවැති මාධ්‍ය හමුවකදී ඇමැතිවරයා මේ බව සඳහන් කළේය.

කොරෝනා වෛරසයේ බලපෑම හේතුවෙන් සංචාරකයන්ගේ පැමිණීමට යම් බලපෑමක් සිදුවූවත්, ලංකාව ආර්ථිකය වර්ධනයක් සිදුවන බව එම නිවේදනයේ දැක්වෙන බවද ඇමැතිවරයා පැවසීය.

ඉකුත් වසරේ (2019) අග භාගයේදී මෙරට නිෂ්පාදන හා සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනයක් සිදුවී ඇති බව, නිවේදනයේ සඳහන්ව ඇතැයිද ඇමැතිවරයා කීවේය.